**ජාතික උරුමයක් ලෙස පිළිගෙන ඇති ථෙරවාද ත්‍රිපිටකය විකෘති කිරීම වැළැක්වීමට විධිවිධාන සැලැස්වීම පිණිස සහ ඊට ආනුෂාංගික වන්නා වූ කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස 2021 ත්‍රිපිටක සංරක්ෂණ පනත යනුවෙන් පනත් කෙටුම්පතක් බුද්ධ ශාසන අමාත්‍යවරයා වශයෙන් මහින්ද රාජපක්ෂ අගමැතිවරයා 2021 පෙබරවාරි 28 දාතම සහිතව අමාත්‍ය මණ්ඩල සංදේශයක් මගින් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කොට ඇත. එහෙත් එය කුමන මූලාශ්‍රයකින් ඇති වූයේ ද යන්න සහ කාගේ වුවමනාවක් වෙනුවෙන් සිදුකරනු ලබන්නක් ද යන්න පිළිබඳව භික්ෂුන්වහන්සේලාට මෙන්ම බෞද්ධ සමාජයට අවබෝධයක් නැත.**

# සංරක්ෂණය කළ යුත්තේ ත්‍රිපිටකයද? ශාසනයද?

**ත්‍රිපිටක සංරක්ෂණ පනත**



යෝජිත පනත අනුව ත්‍රිපිටක සංරක්ෂණ මණ්ඩලයක් ස්ථාපිත කරනු ලබන අතර සියම්, අමරපුර, රාමඤ්ඤ නිකායන්හි මහානායක හිමිපාණන්වහන්සේලා හතර නමගෙන් ද, තවත් භික්ෂුන්වහන්සේලා 36 නමකගෙන් ද, සංරක්ෂිත ත්‍රිපිටක ග්‍රන්ථ සම්පාදන මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් ද එය සමන්විත වේ. පිළිගත් ථෙරවාදී පාලි පිටකයේ, පාලි අට්ඨකථාවල, පාලි ටීකාවල සහ ඒවායෙහි පරිවර්තනවල අක්ෂර, පද, වාක්‍ය, ඡේද, ථෙරවාදනුකූල හා පාලි ව්‍යාකරණානුකූල අර්ථ සහ ථෙරවාද ත්‍රිපිටකයේ සැලැස්ම, පාලි අට්ඨකථාවල සැලැස්ම, පාලි ටීකාවල සැලැස්ම හා ඒවායේ අන්තර්ගතය කිසිදු ආකාරයකින් වෙනස් කිරීම්, විකෘති කිරීම්, විනාශ කිරීම්, අවභාවිතයට ලක්කිරීම්, අයථා භාවිතය යනාදිය වැළැක්වීම එම පනතේ අරමුණු ලෙස ඉදිරිපත් කර ඇත. එම මණ්ඩලයට අධ්‍යක්ෂ ජනරාල්වරයකු පත් කළ යුතු අතර, ඔහු බුද්ධශාසන සම්බන්ධව සර්ව බලධාරී දෙවියන්වහන්සේ සතු බලය දරනු ලබයි.

යම්කිසි පුද්ගලයකු හෝ කණ්ඩායමක් මුද්‍රිත, ඩිජිටල්, ශ්‍රව්‍ය, දෘශ්‍ය, අන්තර්ජාලය යනාදී කවර මාධ්‍යයකින් වුව ද ථෙරවාදී පාලි ත්‍රිපිටකය විකෘති කරනු ලැබුවහොත් හෝ අයථා භාවිතය කරනු ලැබුවහොත් ඔවුන්ට දඬුවම් පැමිණවිය හැකිය. පාලි ත්‍රිපිටකය ලෙස අර්ථ නිරූපණය කර ඇත්තේ විනය පිටකය, සූත්‍ර පිටකය, අභිධර්ම පිටකය, පාලි අට්ඨකථා සහ පාලි ටීකාවන් ය. ථෙරවාදී ත්‍රිපිටක පාලියට අපහාස කිරීම හෝ විකෘති කිරීම වැනි වරදක් සිදු කළ අයකුට මහාධිකරණය විසින් රුපියල් 50,000කට නොවැඩි සහ අවම වශයෙන් මාස 3 සිට උපරිම වශයෙන් අවුරුදු 2 නොඉක්මවන කාලයක් සඳහා සිරදඬුවම් නියම කළ හැකිය. පාලි භාෂාවෙන් දැක්වෙන ථෙරවාද ත්‍රිපිටක පාලියෙහි විධිමත් පරිවර්තනවල කරුණු විකෘති කිරීම හා අවභාවිතට ලක්කිරීම කරනු ලබන තැනැත්තකුට මහාධිකරණය විසින් රුපියල් 50,000කට නොවැඩි දඩයකට සහ අවම වශයෙන් මාස 3 සිට උපරිම වශයෙන් අවුරුදු 2 නොඉක්මවන සිරදඬුවමකට යටත් කළ හැකිය. පිළිගෙන ඇති ත්‍රිපිටකය සමාජගත කිරීමට බාධා පැමිණවීම හෝ ත්‍රිපිටක මණ්ඩලයේ අනුමැතියකින් තොරව කුමන හෝ මාධ්‍යයක් මගින් ඒවා විකෘති කොට දැක්වීම කරනු ලබන තැනැත්තකුට මහාධිකරණය විසින් රුපියල් 100,000කට නොඅඩු සහ රුපියල් 500,000කට නොවැඩි දඩයකින් දඬුවම් කරනු ලැබිය හැකිය. එහි සඳහන් තවත් වැරැදි සම්බන්ධයෙන් රුපියල් 200,000කට නොඅඩු සහ රුපියල් 1,000,000කට නොවැඩි දඩයකට හා අවම වශයෙන් අවුරුදු 2 සිට උපරිම ලෙස අවුරුදු 7ක කාලයක් සඳහා සිරගත කිරීම් මගින් දඬුවම් නියම කළ හැකිය.

ඉහත සඳහන් ක්‍රියා පළමුව නීතිය අනුව කළ හැකි ද යන්නත්, දෙවනුව එසේ නීති පැනවීම බුදුන්වහන්සේ දේශනා කළ ධර්මයට අනුකූලව කළ හැකි ද යන්නත් පිළිබඳව සලකා බැලිය යුතුව ඇත. එසේ නම් එය සිදු කළ යුත්තේ කවුරුන් විසින් ද? බුදු දහමේ උරුමකරුවන් කවුද? බුද්ධ ශාසනයේ පැවිදි වී සිටින භික්ෂුන්වහන්සේලා කිහිප නමකට බුද්ධ ශාසනය උරුම වී ඇත් ද? එසේත් නැති නම් භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා සිව්වනක් පිරිසට එය උරුම වී ඇත් ද? එසේත් නැති නම් බුදුන්වහන්සේ ධර්මය දේශනා කරනු ලැබුවේ ධර්මයේ පිහිට පතන ඕනෑම කෙනකුට එම ධර්මය තුළින් විමුක්තිය ලබාගැනීම සඳහා අවස්ථාව සලසා දෙමින් ද? පනත ඉදිරිපත් කර ඇත්තේ ත්‍රිපිටකය ජාතික උරුමයක්ය යන පදනම මතය. එය ජාතික උරුමයක් බවට පත්වූයේ රටේ තිබෙන කුමන නීතියක් යටතේ ද යන්න පිළිබඳව පනත නිහඬය.

යුනෙස්කෝ සංවිධානය විසින් පිළිගත් ලෝක උරුම ස්ථාන අටක් මෙරට පවතින අතර, ඒවායින් හයක් සංස්කෘතිකමය උරුමයන් වන අතර, ඉතිරි දෙක ස්වාභාවිකව ආරක්ෂා වී ඇති ස්ථානයන්ය.

සංස්කෘතිකමය උරුමයන් ලෙස පොලොන්නරුව ඉපැරැණි නගරය, සීගිරිය, පැරැණි ගාලු නගරය සහ කොටුව, රන්ගිරි දඹුලු ලෙන් විහාරය, අනුරාධපුර ශුද්ධ නගරය සහ මහනුවර ශුද්ධ නගරය ලෝක උරුමයන් ලෙස පිළිගෙන ඇත. ස්වාභාවිකව ආරක්ෂා වී ඇති උරුම වශයෙන් සිංහරාජ වනාන්තරය සහ මධ්‍යම කඳුකරයේ උස් බිම් නම් කොට ඇත.

ක්‍රිස්තු පූර්ව පළමු වැනි සියවසේ වළගම්බා රජ දවස මාතලේ අලුවිහාරයේ දී ග්‍රන්ථාරූඪ කරන ලද ත්‍රිපිටකය ථෙරවාදී ත්‍රිපිටකය වශයෙන් අප හඳුන්වනු ලබන අතර බුදුන් වහන්සේ දේශනා කළ නිර්මල ධර්මය ඇතුළත්ව තිබෙන්නේ එම ත්‍රිපිටකයේ බවට දැඩි විශ්වාසයක් පවතී. අනිකුත් බෞද්ධ රටවල ද ත්‍රිපිටක ලෙසට ග්‍රන්ථ ලියා ඇති නමුත් බුදුන්වහන්සේ දේශනා කළ ධර්මය මුලින්ම ග්‍රන්ථාරූඪ වූයේ අළුවිහාරයේ දී නිසා එහි සත්‍යතාව අභියෝගයට ලක්කළ නොහැකිය. ලෝක උරුමයන් ලෙස ප්‍රකාශයට පත්වී ඇති ස්ථානවලින් සියයට 80ක පමණ ස්ථාන ආගමික සම්බන්ධතාවක් මත ගොඩනැගී ඇත. ඊට හේතුව බොහෝ සංස්කෘතීන් ගොඩනැගී ඇත්තේ ආගමික සම්ප්‍රදායන් සහ චාරිත්‍ර ධර්ම පදනම් කරගෙන වීමය.



ජනාධිපති නීතිඥ, ආචාර්ය

**විජයදාස රාජපක්ෂ**

සාම්ප්‍රදායිකව මවුපියන්ගේ ආගම ඇදහීමට දරුවන් පුරුදු වුවත් ආගම් ඇදහීමට ඇති නිදහස එමඟින් අභියෝගයට ලක්කළ නොහැකිය. අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (1) (ඉ) ව්‍යවස්ථාව අනුව එකලාව හෝ අන් අය සමග ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව තම ආගම, ලබ්ධිය හෝ විශ්වාසය ඇදහීමෙන්, පිළිපැදීමෙන්, ප්‍රගුණ කිරීමෙන් සහ ඉගැන්වීමෙන් ප්‍රකාශ කිරීමේ නිදහස මූලික මානව අයිතිවාසිකමක් ලෙස පිළිගෙන ඇත. අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබා දී ඇති මූලික අයිතිවාසිකමේ නිදහසට වඩා වැඩි නිදහසක් ආගම් ඇදහීම් සම්බන්ධව ලබා දී ඇත්තේ බුදුරජාණන්වහන්සේය.

ලෝකයේ අතිබහුතරයක් ජනතාව අදහනු ලබන ආගම් බවට පත්ව ඇත්තේ ක්‍රිස්තියානි (කතෝලික ඇතුළුව), හින්දු, ඉස්ලාම් වැනි ආගම්ය. එම සෑම ආගමක් තුළම අනුගාමිකයන් විසින් අනුගමනය කළ යුතු ආගමික සම්ප්‍රදාය පද්ධතිය තුළ නීතිමය ස්වරූපයක් ගැබ්ව ඇත. එවැනි නෛතිකමය වශයෙන් සැලකෙන නැතහොත් අනිවාර්ය ලෙස අනුගමනය කළ යුතු බවට පැනවූ නියමයන් රහිත ආගමක් ලෙස සැලකෙනුයේ බුදුන්වහන්සේ දේශනා කළ ධර්මය පමණි. එය ආගමික ස්වරූපයෙන් පැවැත ආව ද ආගමක් ලෙස පටු අර්ථයෙන් අර්ථ නිරූපණය කළ හැකි ද යන්න පිළිබඳ කාරණය වෙනම සාකච්ඡා කළ යුතුව ඇත.

බුදු දහම අනුව කිසිදු දෙයක් කිරීමට හෝ නොකිරීමට බලකිරීමක් නොමැති අතර යහපත් දෙයක් සිදුකළහොත් යහපත් ප්‍රතිඵල ද අයහපත් දෙයක් සිදු කළහොත් අයහපත් ප්‍රතිඵල ද ඇතිවන ආකාරය ලෝකයේ පවතින යථාර්ථය වශයෙන් තේරුම් කොට ඇත. බුදුන්වහන්සේ භික්ෂුන්ට අනුසාශනා කොට ඇත්තේ බොහෝ මිනිසුන්ගේ හා දෙවිවරුන්ගේ හිත සුව පිණිස උතුම් වූ සද්ධර්මය දේශනා කරන ලෙසය. බුදු දහම ඇදහීම යනු දෙවියන් සමග කරන ගනුදෙනුවක් නොව සිය හෘද ශාක්ෂිය සමග කරනු ලබන ගනුදෙනුවකි.

**සබ්බපාපස්ස අකරණං - කුසලස්ස උපසම්පද**

**සචිත්තපරියොදපනං - එතං බුද්ධාන සාසනං (ධම්ම පදය, බුද්ධ වර්ගය)**

සියලු අකුසල කර්මයාගේ (පව්) නොකිරීම ද, සියලු කුසල කර්මයාගේ (පින්) ඉපදවීම ද තමාගේ සිත පිරිසුදු කිරීම ද යන ඉගැන්වීම සියලු බුදුවරයන්ගේ අනුශාසනයයි.

**මේ වනවිට ලෝකයේ බොහෝ දෙනකුගේ අවධානය බුදු දහම වෙත නැඹුරු වී ඇත්තේ එහි පවතින නිදහස සහ ස්වාධීනත්වය හේතුවෙනි. අන්‍ය ආගමිකයකු හට හෝ ආගමක් නොඅදහන අයකුට බුදු දහම ද තවත් ආගමික නීති පද්ධතියක් නම්, ඔවුන් වෙනත් ආගමක් අතහැර බුදු දහම අදහනු ලබන්නේ කුමන හේතුවක් නිසාවෙන් ද?**

මේ වනවිට ලෝකයේ බොහෝ දෙනකුගේ අවධානය බුදු දහම වෙත නැඹුරු වී ඇත්තේ එහි පවතින නිදහස සහ ස්වාධීනත්වය හේතුවෙනි. අන්‍ය ආගමිකයකු හට හෝ ආගමක් නොඅදහන අයකුට බුදු දහම ද තවත් ආගමික නීති පද්ධතියක් නම්, ඔවුන් වෙනත් ආගමක් අතහැර බුදු දහම අදහනු ලබන්නේ කුමන හේතුවක් නිසාවෙන් ද? අපි ශ්‍රී ලංකාවේ ථෙරවාදී බුදු දහම සහ ථෙරවාදී ත්‍රිපිටකය බුදු දහම නමැති රාමුවකට කොටු කිරීමට උත්සාහ කළත් මහායාන බුදු දහමේ ලක්ෂණ ද ඕනෑ තරම් අපගේ ශාසනයට ඇතුළු වී ඇත. එහෙත් ඒ පිළිබඳ මනා සිහිනුවණින් යුතුව දහම ආරක්ෂා කරගැනීමට බෞද්ධයන් විචක්ෂණශීලිය.

බුදුන්වහන්සේ දේශනා කළ ධර්මය විකෘති කිරීමෙහි ලා උත්සුක වූවෝ මෙකල පමණක් නොව එකල ද සිටියහ. දෙව්දත් තෙරගේ අනුගාමික සාති භික්ෂුව බුදුන්වහන්සේගේ ධර්මය විකෘති කරමින් ගමින් ගමට ගොස් දේශනා කිරීම සිදු කළේ බුදුන් වැඩ සිටි දෙව්රම් වෙහෙරේ සිටිමින්මය. එමෙන්ම ගිහි කල සිය මස්සිනා වූ දෙව්දත් භික්ෂුව බුදුන්වහන්සේගේ දිවි තොර කරවීමට නොවරක්ම උත්සාහ කළේය.

බුද්ධ පරිනිර්වාණයත් සමගම සුභද්‍ර භික්ෂුවගේ අභද්‍ර වචනය හේතුවෙන් මාස 3ක කාලයක් තුළ පළමු ධර්ම සංගායනාව පවත්වා සංඝ ශාසනය පාරිශුද්ධත්වයට පත් කිරීම සිදු විය. එහි දී තීරණය වූයේ ධර්මයට කලින් විනය කරුණු සංගායනා කළ යුතු බවය. ඊට හේතු වූයේ බෞද්ධ ශාසනය පවතිනුයේ බෞද්ධ විනය පවත්වාගෙන යනතාක් පමණක් වන නිසාවෙනි. ඉන් පසුව බුද්ධ පරිනිර්වාණයෙන් වසර 100කට දෙවැනි ධර්ම සංගායනාව පවත්වා වජ්ජිපුත්තක භික්ෂුන්ගේ දස වස්තුක මිත්‍යා දෘෂ්ටිය හැර දමා සංඝ ශාසනය පරිශෝධනය කිරීම සඳහා දුසිල්වත් භික්ෂුන් 10,000ක් ශාසනයෙන් නෙරපා දමනු ලැබූහ. ඉන් පසුව අශෝක අධිරාජයාගේ කාලයේ දී 3 වැනි ධර්ම සංගායනාව පවත්වා දුසිල්වත් භික්ෂුන් 60,000ක් ශාසනයෙන් නෙරපා දමනු ලැබූහ. එහෙත් වර්තමානයේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත වී රටවල එවැන්නක් පිළිබඳව විශ්වාසයක්වත් තැබීම බොළඳකමකි. එවැන්නක් ඒකාධිපති රටක වුව ද ප්‍රයෝගික නැත.

සිදුහත් බෝසතුන් වහන්සේ බුද්ධත්වයට පත්ව වසර විස්සක් යන තෙක් භික්ෂු භික්ෂුණීන් වෙනුවෙන් සික්ෂා පද නොපැනවූහ. වසර විස්සකට පසු භික්ෂුන්ගේ චර්යාවන් හේතුවෙන් සික්ෂා පද පැනවීම අවශ්‍ය විය. භික්ෂුන් වෙනුවෙන් විනය ශික්ෂාපද 227ක් ද, භික්ෂුණීන් වෙනුවෙන් විනය ශික්ෂා පද 311ක් ද පනවන්නට යෙදුණි. පාරාජිකා පාලියේ සඳහන් වන පරිදි ආසවට්ඨානීය ධර්මයන් සංඝ සංස්ථාව තුළ පහළ වීම හේතුවෙන් එසේ පනවන්නට යෙදුණි.

එමෙන්ම බුද්ධ ශාසනයේ පැවැත්ම පිණිස පහත අංග තුන පැවැතිය යුතුය.

**1. පර්යාප්තිය හෙවත් බුදුන් වදළ නිර්මල චතුරාර්ය සත්‍යය දහම පැවැතීම**

**2. ප්‍රතිපත්ති පිරීම**

**3. ප්‍රතිවේධ හෙවත් මාර්ගඵල ළඟා කරගත හැකි වීම. ඒ සඳහා විනය ශික්ෂාපද අනුගමනය කිරීම අත්‍යවශ්‍ය වේ.**

ලොවක් කම්පිත කළ කාලිංග දේශය ලෙයින් තෙත් කළ කුරිරු සහ දැඩි චිත්ත සන්තානයක් පැවැති චණ්ඩාශෝක වැනි රජකුගේ සිත සන්සුන් කොට මහා කාරුණික පාලකයකු කිරීමේ හැකියාව සංඝ ශාසනයේ සුසිල්වත් වූ අවුරුදු 8ක් වයසැති කුඩා සාමණේර නමක් වූ නිග්‍රෝධ හිමියන් තුළ පැවැතීම තුළින් ප්‍රකටව පෙනී යන කරුණ වන්නේ බෞද්ධ භික්ෂුවකගේ ශීලය අනාගත ලෝකයේ ගමන් මග සුබවාදීව වෙනස් කිරීමට හැකි ප්‍රබල සාධකයක් වූ බවය. එම කුඩා සාමණේර නම නොසිටින්නට ධර්මාශෝක කෙනෙක් බිහි නොවන අතර අනුබුදු මිහිඳු හිමි නමක් සහ සංඝමිත්තා මහ තෙරණින්වහන්සේ නමක් ලොවට බිහි නොවන්නට ඉඩ තිබුණි. එසේ වූයේ නම් ලාංකේය අපට ධර්මාලෝකය දර්ශනය නොවීමට ඉඩ තිබුණි.

බුදුන්වහනසේ ධර්මය දේශනා කළේ මාගධී භාෂාවෙනි. ත්‍රිපිටකය ලියා ඇත්තේ පාලියෙනි. යෝජිත පනතෙහි සඳහන් කර ඇත්තේ හෙළබිම අරහතුන් වහන්සේලා විසින් ලේඛනගත කරන ලද මුල් ත්‍රිපිටකය විය නොහැක. පසු කාලීනව වෙනස්කම්වලට භාජන කරන ලද මූලාශ්‍රයන් ග්‍රන්ථාරූඪ කොට සාදන ලද ත්‍රිපිටකයයි. බුද්ධ ජයන්ති ත්‍රිපිටකය දෝෂ සහිත පරිවර්තනවලින් යුත් එකක් බව එහි සංඥාපනයෙහි ම සඳහන් කොට ඇත.

විභංග වර්ගයේ භද්දේකරත්ත සූත්‍රය, ආනන්ද භද්දේකරත්ත සූත්‍රය, මහාකච්චාන භද්දේකරත්ත සූත්‍රය, ලෝමසකංගිය භද්දේකරත්ත සූත්‍රය යන සූත්‍රවල භද්දේකරත්ත යන වචනය පරිවර්තනය කොට ඇත්තේ "භද්‍ර වූ එක් රැය" යනුවෙනි. එම පාලි වචනවල නියම අර්ථය ලෙස සන්ධි වූ විට අදහස්වනුයේ පහත සඳහන් ආකාරයටය. භද්ද+ඒක+රත්ත

**භද්ද = සොඳුරු**

**ඒක = හුදකලා වූ**

**රත්ත = ඇළුණු**

**එනම් "සොඳුරු හුදකලාවෙහි ඇලුණු" යන්නයි.**

සංයුත්ත නිකායේ ගාමිණී සංයුත්තයේ තාලපුට සූත්‍රයෙහි "ආචරියපාචරියානං" යන්න "අජර පැජර" ලෙස පරිවර්තනය කොට ඇත. ඉන් අදහස් කරන්නේ "ආචාර්ය ප්‍රාචාර්යවරුන්" යන්නය. එහෙත් එය තේරුම් ගත හැක්කේ කාට ද? මේ උදාහරණ කිහිපයක් පමණි. විශේෂයෙන්ම ගිහියන් හට පාලි භාෂාව නොතේරෙන අතර අද සිටින භික්ෂුන්වහන්සේලා අතරින් ද පාලි භාෂාව නිසි පරිදි ප්‍රගුණ කර ඇත්තේ ඉතා සීමිත සංඛ්‍යාවක් පමණි.

මජ්ඣිම නිකායේ බාල පණ්ඩිත සූත්‍රය බුද්ධ ජයන්ති ත්‍රිපිටකයේ සඳහන්ව ඇත්තේ මෙසේය.

**"එපරිද්ම මහණෙනි, පණ්ඩිතයා පීඨයෙහි නැගීසිටියහු මඤ්චයෙහි නැගීසිටියහු වේවයි බිමැ හෝනහු වේවයි ඔහු විසින් පෙර කරනලද කායසුචරිත වූ වාක්සුචරිත වූ මනස්සුචරිත වූ යම් කුසල කර්ම කෙනෙක් ඇද්ද, එසමයෙහි ඔහුට ඒ කර්මයෝ අවලම්බන අධ්‍යවලම්බන අභිප්‍රලම්භන වශයෙන් එළඹ සිටිත්."**

මෙය කා හට නම් තේරුම් ගත හැකි ද?

**(මතු සම්බන්ධයි)**